වාර්ෂික වාර්තාව

வருடாந்தஅறிக்கை

Annual Report

2019

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

தேசியதொழில்முயற்சிஅபிவிருத்திஅதிகாரசபை

National Enterprise Development Authority

කර්මාන්ත කටයුතු අමාත්‍යාංශය

கைத்தொழில் அமைச்சு

Ministry of Industry

N E D A

හැදින්වීම

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය 2016 අංක 07 දරන පාර්ලිමේන්තු පනත යටතේ 2006 වර්ශයේදී පිහිටුවන ලදී.ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් හට පහසුකම් සැපයීමට මෙම ආයතනය වෙත බලය පැවරී ඇත.දේශීය ව්‍යවසායකයන් හට යටිතල පහසුකම් මූල්‍ය හා ප්‍රතිපත්ති මට්ටමේ සහයෝගය ලබා දීම සඳහා අධිකාරී පනතේ නීති මගින් බලය පවරා ඇත.

රේඛීය අමාත්‍යාංශයේ උපදෙස් හා මග පෙන්වීම අනුව කළාපීය මට්ටමේ මෙන්ම ජාතික මට්ටමේ විවිධ ක්‍රියාකාරකම් සඳහා අධිකාරිය සම්බන්ධ වී ඇත.ආයෝජන ප්‍රවර්ධනය හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ යටතේ 2006 වර්ශයේ සිට 2010 වර්ශය දක්වා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය ලැයිස්තුගත වී තිබුනි.ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය 2010 වර්ශයසිටකර්මාන්ත හා වාණිජ්‍ය කටයුතුඅමාත්‍යාංශයයටතට පත්වී මේ දක්වා කර්මාන්ත හා වාණිජ්‍ය කටයුතු අමාත්‍යාංශය යටතේ පාලනය වේ.

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියසුළු හා මධ්‍ය පරිමාණව්‍යවසායකයන් හට ප්‍රාදේශිය ලේඛම් කොට්ඨාශ මට්ටමෙන් විවිධ වැඩසටහන් ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් ආරම්භ කරන්නට යෙදුණි.එ ය රාජ්‍ය හා පුද්ගලික බැංකු, ව්‍යාපාරික මන් ඩල, රාජ්‍ය නොවන සංවිධාන (දේශීය හා විදේශීය) ආදී රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන හා සම්බන්ධ වී ඇත.මෙම වැඩසටහන් වල පරමාර්ථය වී ඇත්තේ බිම් මට්ටමේසුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්හටමූල්‍ය සහයෝගීතාවය, පුහුණු හා උපදේශක සහයෝගීතාවය වැනි මූලික අවශ්‍යතාවයන් සැපයීම වේ.ප්‍රාදේශිය ලේඛම්කාර් යාල මට්ටමෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සම් බන් ධීකරණය සඳහා ප්‍රාදේශිය මට්ටමේ නිලධාරීන් ප්‍රාදේශිය ලේඛම් කාර් යාල වලට අනුයුක්ත කර ඇත.

දැක්ම

“ජාතියේආර්ථික, දේශපාලනික හා සමාජ අභිලාෂයන් සපුරාලීමෙහි ලා දායකත්වය සැපයිය හැකි තරඟකාරී ව්‍යවසායකත්ව ක්ෂේත්‍රයක් ශක්තිමත් හා තිරසාර අන්දමින් ගොඩනැංවීම”

මෙහෙවර

“ශ්‍රී ලංකා ජාතික ආර්ථිකයේ ප්‍රමුඛ අංගයක් වශයෙන් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA) යටතේ ඇති ව්‍යවසායන්හි සංවර්ධනය, පැවැත්ම හා තරඟකාරීත්වය නැංවීම උදෙසා පහසුකම් සැපයීම හා සක්‍රිය අන්දමින් සහාය දැක්වීම”

අරමුණු

- ✓ ශ්‍රී ලංකාව තුළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව සංවර්ධනය දිරිගැන්වීම, ප්‍රවර්ධනය සහ පහසුකම් සැපයීම මගින් ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධනය, ව්‍යාප්තිය හා සංවර්ධනය වේගවත් කිරීමට දිරි දීම.
- ✓ ජාතිකව්‍යවසායසංවර්ධනඅධිකාරි**(NEDA)**

  පනතේපරමාර්ථයන්ඉටුකිරීමෙහිලාවිදේශීයවෙළඳපොළඅවශ්‍යතා සැපිරිය හැකි දේශීය ව්‍යාපාර ශ්‍රී ලංකාවෙන් බැහැරව අන්තර්ජාතික මට්ටමින් ස්ථාපිත කොට පවත්වාගෙන යාමට හැකි පරිදි සැලසුම් කිරීමට පෙළැඹවීම හා ඒ සඳහා දිරිගැන්වීම.
- ✓ කර්මාන්ත හා කෘෂිකාර්මික ක්ෂේත්‍රයන්හි වෙළඳ හා සංවර්ධන කටයුතු ඵලදායී අන්දමින් ප්‍රවර්ධනය කිරීමට සහ සහාය වීමට අවශ්‍ය වන්නා වූ ප්‍රතිපත්ති, සැළසුම් සහ සැළසුම්ගත ප්‍රවර්ධන දිරිදීමනා සම්පාදනය කිරීම.
- ✓ ව්‍යවසාය සංවර්ධනයේ ප්‍රමුඛ අවශ්‍යතාවයක් වශයෙන් තාක්ෂණික කුසලතා පරිපූර්ණ මානව ප්‍රාග්ධනයක් වශයෙන් ජනතාව සවිබල ගැන්වීම.
- ✓ සංවර්ධන අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- ✓ ව්‍යවසාය සංවර්ධනයට සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය දායකත්වයට ප්‍රවේශය සඳහා ව්‍යවසායකයින්ට පහසුකම් සැපයීම.
- ✓ නිශ්පාදන සංවර්ධනය, තාක්ෂණික වැඩිදියුණු කිරීම් සහ පේටන්ට් බලපත්‍ර වාණිජකරණය සම්බන්ධයෙන් වන පර්යේෂණ හා සංවර්ධනය ඉහල නැංවීම සඳහා තාක්ෂණ සංවර්ධන අරමුදලක් පිහිටුවීම.
- ✓ ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනයට පහසුකම් සැලසීම.

අධ්‍යක්ෂකමණ්ඩලය

1. ඩී.කේ. බෝගොල්ලාගම මයා - සභාපති/අධ්‍යක්ෂ ජනරාල්
2. එස්. බාලසුබ්‍රමනියම් මයා : කමිටු සාමාජිකඅතිරේක ලේකම්කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය
3. එච්.ඒ. තාරකා එරන්දි මිය : කමිටු සාමාජිකසහකාර අධ්‍යක්ෂරාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය
4. මංජුල සමරවික්‍රම මයා : කමිටු සාමාජික
5. එම්.එස්.එම්. නදීර් මයා : කමිටු සාමාජික
6. හිමාලි ජිනදාස මිය :කමිටු සාමාජික
7. එම්.එෆ්.එස්.ඩබ්. ස්ටෙම්බෝ මයා :කමිටු සාමාජික
8. සෙයිනුදීන් මරික්කාර් ඉල්හාම් මයා : කමිටු සාමාජික
9. නයිනා මොහමඩ් සරූර් මයා : කමිටු සාමාජික
10. ෆස්නා මිය (කමිටු ලේකම්)

2023 මැයි 04

ගරු පාර්ලිමේන්තු රමෙෂ් පතිරණ මහතා

කර්මාන්ත කටයුතු අමාත්‍ය

කර්මාන්ත අමාත්‍යාංශය

අංක 73/1,

ගාලු පාර

කොළඹ 03

ගරුඅමාත්‍යතුමනී,

වාර්ෂික වාර්තාව 2019

1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) වහන්තිය ප්‍රාකාර පහත සඳහන් ලියවිලි මේ සමග ඉදිරිපත් කරමි.

1. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ 2019 වර්ශය සඳහා වූ ප්‍රගති වාර්තාව
2. 2019දෙසැම් බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය,ආදායම්පිළිබඳප්‍රකාශනය, හිමිකම්වෙනස්වීම්පිළිබඳප්‍රකාශනය
3. **විගණකාධිපති වාර්ථාව**

ඔබේ අවංක,

ලසන්ත කාරියප්පෙරුම

සභාපති / අධ්‍යක්ෂ ජනරාල්

වාර්ෂික වාර්තාව 2019

සංවර්ධන වැඩසටහන්

වැඩසටහන 01 : සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් පිළිබඳ මාර්ගෝපදේශය
(ව්‍යාපාර සංවර්ධන සේවා අත්පොත සකස් කිරීම)

වැඩසටහන 02 : ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සම්මාන ප්‍රදානෝත්සව

වැඩසටහන 03 : දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංසද

වැඩසටහන 04 : පර්ෂද(පොකුරු)/ක්ෂේත්‍ර සංවර්ධන වැඩසටහන

වැඩසටහන 05 : ව්‍යාපාරික වෙළඳ ප්‍රදර්ශන

වැඩසටහන 06 : ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන

වැඩසටහන 07 : විකාශන හා තාක්ෂණික හුවමාරු මධ්‍යස්ථානය(ITTC)- මාකඳුර ස්ථාපිත කිරීම

වැඩසටහන 08 : Uni-ව්‍යවසායකයෝ (උපාධිධාරී ව්‍යවසායක උදානය)

වැඩසටහන 09 : ආධාරක දැනුමෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් ඉහළ නැංවීම

වැඩසටහන 10 : ව්‍යවසායකත්ව සංවර්ධනය තුළින් ශ්‍රී ලාංකික තරුණ ප්‍රජාව බලගැන්වීම

වැඩසටහන 11 : වෙනත් වැඩසටහන්

සංවර්ධන වැඩසටහන් - 2019

වැඩසටහන 01: ව්‍යාපාර සංවර්ධන සේවා (BDS)අත්පොත සකස් කිරීම

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA) ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් (MSME)සඳහා මෙන්ම ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය මාර්ගෝපදේශ අත්පොත (ව්‍යාපාර සංවර්ධන සේවා (BDS)නාමාවලිය) ප්‍රකාශයට පත් කිරීමට සැලසුම් කර ඇත. මෙම මාර්ගෝපදේශයෙහිව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් පිළිබඳ තොරතුරු ඇතුළත් වන අතර, සාර්ථක ව්‍යාපාරයක් ආරම්භ කිරීමෙහිලා මහ පෙන්වීමේ ලේඛනයක් වශයෙන් එය ඔවුනට ඉතා ප්‍රයෝජනවත් වනු ඇත (පිටු 200 ක් පමණ). ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින්, අධිකාරිය යටතේ සේවය කරන සංවර්ධන නිලධාරීන්ගෙන් සහ පුවත් පත් වෙළඳ දැන්වීම් මගින් තොරතුරු එක්රැස් කර ගන්නා ලද අතර,එම මාර්ගෝපදේශය2020 වසරේ දී ප්‍රකාශයට පත් කිරීමට සැලසුම් කර ඇත.

වැඩසටහන 02 : ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සම්මාන ප්‍රදානෝත්සව

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට ප්‍රබල දායකත්වයක් ලබා දී ඇති ව්‍යාපාර හඳුනා ගැනීම, ඇගයීම සහ දිරිගැන්වීම අරමුණු කර ගනිමින් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් ව්‍යවසායකත්ව සම්මාන උළෙල පවත්වනු ලබයි. දිස්ත්‍රික් මට්ටමේ බලයලත් ආයතන / රාජ්‍ය ආයතනවල සහාය ඇතිව ජාතික මට්ටමේ සම්මාන ප්‍රදානෝත්සවයක් සහ සෑම පළාතක්ම ආවරණය කරමින් සම්මාන උළෙල 9 ක් පැවැත්වීමට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සැලසුම් කර ඇත.

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් බස්නාහිර, සබරගමුව, මධ්‍යම, උතුරු මැද හා දකුණු පළාත් තුළ සම්මාන ප්‍රදානෝත්සව පහක් පවත්වා ඇති අතර, ජාතික මට්ටමේ සම්මාන ප්‍රදානෝත්සවය 2020 වර්ෂයේදී පැවැත්වීමට සැළසුම් කර ඇත.



සම්මාන ප්‍රදානෝත්සවය: මධ්‍යම පළාත



සම්මාන ප්‍රදානෝත්සවය: බස්නාහිර පළාත

වැඩසටහන 03: දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංසද

ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් වැඩි සංඛ්‍යාවක් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (MSMEs) ක්ෂේත්‍රයේකටයුතු කරන අතර, දරිද්‍රතාවය අවම කිරීමේ කාර්යභාරයේ වැඩි කොටසක් ද මෙම ක්ෂේත්‍රය තුළින් ආවරණය කෙරේ. එබැවින්, මෙම ව්‍යවසායන් සඳහා හිතකර හා ගතික ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම ඉතා වැදගත් වේ. මෙහිදී, රාජ්‍ය හා පෞද්ගලික ව්‍යවසායන් අතර බොහොමයක් අන්තර් ක්‍රියා ප්‍රාදේශීය මට්ටමින් සිදුවන බැවින්, දේශීය ආර්ථික යාන්ත්‍රණයේ වැදගත්කම සැලකිල්ලට ගතයුතුව ඇත. ඒ මත පදනම්ව, දේශීය ආර්ථික සංවර්ධන ක්‍රමෝපාය ක්‍රියාවට නැංවීම(LED)සාම්ප්‍රදායික සංවර්ධන ක්‍රමෝපායන් සඳහා ආකර්ශනීය විකල්පයක් වන අතර, මෙම දේශීය ආර්ථික සංවර්ධන ක්‍රමෝපායේ වාසිය වනුයේ ප්‍රාදේශීය මට්ටමේ අවශ්‍යතා අනුව උපාය මාර්ග සකසා ගැනීමට ඇති හැකියාවයි. දේශීය ආර්ථික සංවර්ධනය (LED)යනු සංවර්ධනය සඳහා සහභාගීත්ව ප්‍රවේශයකි. දේශීය ආර්ථික විභවය සාක්ෂාත් කර ගැනීම උදෙසා පුළුල් පරාසයක දේශීය පාර්ශ්වකරුවන් ප්‍රාදේශීය මට්ටමින්, ජාතික මට්ටමින් රජය සමග හා ජාත්‍යන්තර සංවිධාන සමග කටයුතු කරනු ලබයි. දේශීය ආර්ථික සංවර්ධන (LED) ක්‍රමෝපාය මගින්සහභාගීත්වය කෙරෙහි අවධානය යොමු කරමින්, දේශීය පෞද්ගලික හා රාජ්‍ය අංශයේ පාර්ශ්වකරුවන් අතර මෙන්ම සමාජ හා දේශපාලන කණ්ඩායම් අතර දිරිගැන්වීම්, අවස්ථාවන් හා හවුල්කාරීත්වයන් ද ඇතිකරයි.

දේශීය ආර්ථික සංවර්ධනයෙහිලා රාජ්‍ය-පෞද්ගලික සංවාදයක් ඇති කිරීම උදෙසා ජාතික හා පළාත් රජයේ බලධාරීන්, පෞද්ගලික අංශය, රාජ්‍ය නොවන සංවිධාන සහ රජයට අවශ්‍ය සේවා සපයන්නන්ගේ නියෝජිතයින් එක් කරන දිස්ත්‍රික් ව්‍යවසායකත්ව සංසද (DEF) සෑම දිස්ත්‍රික්කයකම ස්ථාපිත කර ඇති අතර එහි සභාපතිත්වය දිස්ත්‍රික් ලේකම් විසින් දරනු ලැබේ. ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංසදයෙහි (REF) සභාපතිත්වය දරනු ලබන්නේ ප්‍රාදේශීය ලේකම්වරයා වන අතර ව්‍යාපාර ක්ෂේත්‍රයේ ප්‍රධාන ව්‍යවසායකයින් සහ දිස්ත්‍රික් සංසදයෙහි මෙන් ම සියලුම ප්‍රාදේශීය මට්ටමේ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් නියෝජනය කරයි.





ප්‍රාදේශීය ව්යවසායකත්ව සංසදය – තිහගොඩ දිස්ත්‍රික් ව්‍යවසායකත්ව සංසදය – පුත්තලම

දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ව්‍යවසායකයින්ට ව්‍යාපාර සංවර්ධන සේවා සැපයීමට නිසි යාන්ත්‍රණයක් සකස් කිරීම සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංසද පිහිටුවා ඇත. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංසද පිහිටුවීමට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියසැලසුම් කර ඇත.

2019වසර දක්වා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියවිසින් දිස්ත්‍රික්ව්‍යවසායකත්ව සංසද 14 ක් සහ ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංසද 222 ක් පිහිටුවා ඇත. ව්‍යවසායකත්ව සංසද රැස්වීම් මාස දෙකකට / තුනකට වරක් පවත්වනුලැබේ.

වැඩසටහන 04: පර්ෂද(පොකුරු) / ක්ෂේත්‍ර සංවර්ධන වැඩසටහන

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (MSMEs) ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය හා විවිධාංගීකරණය සඳහා වූ ධාවකයක් ලෙස පිළිගැනේ. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් හුදෙකලා ආකාරයෙන් කටයුතු කරන අතර,අඟය දාමය තුළ ස්වාධීනව කටයුතු කිරීමට සිදුවී ඇති නමුත්, තරහකාරීත්වයට අබණ්ඩව ප්‍රතිචාර දැක්වීමේ හැකියාව තනිව වර්ධනය කර ගැනීමක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ටදුෂ්කර කාර්යයකි.මෙම ගැටළුව මහහරවා ගැනීම සඳහා, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්සංවර්ධනය සඳහා පර්ෂද / ක්ෂේත්‍ර පදනම් කරගත් ප්‍රවේශය වෙත නැඹුරු විය යුතුය.

පර්ෂද / ක්ෂේත්‍ර පදනම් කරගත් ප්‍රවේශය තුළපවතින වාසි රැසකි. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායපොකුරු වලට පුහුණුව හා තාක්ෂණික නවෝත්පාදනයන්, මූල්‍ය කටයුතු සඳහා පහසු ප්‍රවේශය සහ වැඩි ආයතනික සහායක් ලබා ගැනීමේ අවස්ථා පවතී. විවිධ ස්ථානවලක්‍රියාත්මක වන තනි ව්‍යාපාරවලට ව්‍යාපාර සංවර්ධන සේවා සැපයීමට වඩාපොකුරක් වශයෙන් ක්‍රියාත්මක වන ව්‍යාපාර සමූහයකට එකී සේවාවන් (BDS) සැපයීම රජයට සහ අනෙකුත් සහායක සේවා සැපයීමේ ආයතනවලට වඩා ලාභදායී වේ.

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය 2019 දී ව්‍යාපාර පොකුරු සංවර්ධන වැඩසටහනට සම්බන්ධ වූ අතර, එමගින් වෙළඳපල සංවර්ධනය, ව්‍යවසායකත්ව සංවර්ධනය, තාක්ෂණික හුවමාරුව සහ මූල්‍ය සහාය ලබාගැනීම යනාදී ක්ෂේත්‍රයන්හි ඔවුන්ගේ හැකියාවන් වර්ධනය කරලීම අපේක්ෂාවයි. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියව්‍යාපාරික ක්ෂේත්‍ර15 ක් හඳුනාගන්නා ලද අතර, ප්‍රතිලාභීන් 467 ක් සඳහා සංවර්ධන වැඩසටහන් පවත්වන ලදී.

ව්‍යාපාරික ක්ෂේත්‍රය	**දිස්ත්‍රික්කය**	**ප්‍රතිලාභීන් සංඛ්‍යාව**
ජාවා බතික්	බදුල්ල	25
මල් වගාව	ගම්පහ	21
කොහු නිශ්පාදන	කළුතර	16
ළමා ඇඳුම්	අනුරාධපුර	30
ගමන් මලු	අම්පාර	20
බතික් මෝස්තර නිර්මාණය	මාතලේ	34
පිරිමි කොන්ඩා කැපීම	කුරුණෑගල	30
රූප ලාවන්‍ය	පුත්තලම	50
මල් වගාව	මාතර	48
රූප ලාවන්‍ය	ගාල්ල	74
හඳුන්කූරු නිශ්පාදනය	හම්බන්තොට	10
පොල්කටු නිශ්පාදන	රත්නපුර	19
විසිතුරු භාණ්ඩ	යාපනය	30
ආහාර සැකසුම්කරණය	කිළිනොච්චිය	25
පොල්කටු ආශ්‍රිත නිශ්පාදන	මුලතිවු	25
විසිතුරු භාණ්ඩ	මුලතිවු	10
		467



තාක්ෂණික පුහුණුව - මාතලේ



තාක්ෂණික පුහුණුව - මුලතිවු



උපකරණ බෙදාදීම - මාතර



කොහු නිශ්පාදන - කළුතර



උපකරණ බෙදාදීම - ගම්පහ



සහතිකපත් බෙදාදීම - යාපනය

වැඩසටහන 05 : ව්‍යාපාරික වෙළඳ ප්‍රදර්ශන

ප්‍රාදේශීය මට්ටමින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධනය සඳහා ව්‍යාපාරික වෙළඳ ප්‍රදර්ශන හඳුන්වා දෙනු ලැබේ. කලාපීය මට්ටමින් සහ රට තුළ ඇති ව්‍යාපාරික සංවර්ධන සේවා පිළිබඳව මෙන්ම ව්‍යාපාර සංවර්ධන සේවාආයතනමගින්ඉටුකරනු ලබනකාර්යයන් හා සේවාවන් පිළිබඳව මධ්‍යම, කුඩා හා ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසායකයින් බොහෝ දෙනෙකුට අවබෝධයක් නොමැති බවත්, ඒ හේතුවෙන් එම ආයතනයන් මගින් උපරිම සේවාවක් ලබාගැනීමට අපොහොසත්ව ඇති බවත්, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියවිසින් හඳුනාගන්නා ලදි. ව්‍යවසායකයින් හා ව්‍යාපාර සංවර්ධන සේවා සැපයුම්කරුවන් අතර පවත්නා එකී දුරස්ථභාවය අවම කළහැකි වනුයේඔවුන් අතර ශක්තිමත් සබඳතා ගොඩනැගීම සහ අන්තර් ක්‍රියාකාරීත්වයන් ඇති කිරීම තුළිනි. ඒ අනුවව්‍යාපාරික සේවා වෙළඳ ප්‍රදර්ශන මඟින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් අතර සබඳතා ගොඩනගන අතර, ව්‍යාපාර සංවර්ධන සේවා උපරිම ආකාරයෙන් භාවිතා කිරීමට ව්‍යවසායකයින්ට අවස්ථාව සළසා දෙයි.තවද,එතුළින් අනාගත ව්‍යවසායකයින්ගේ ව්‍යවසායකත්ව හැකියාව ඉහළ නංවනු ඇත.



වෙළඳ ප්‍රදර්ශනය - මාතර

එමෙන්ම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන හඳුන්වා දීමට සහ වෙළඳපල සම්බන්ධතා ඇති කර ගැනීමට මෙය අගනා අවස්ථාවක් වනු ඇත.

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් 2019 වර්ෂයේදී සියළු පළාත් ආවරණය කරමින් වෙළඳ ප්‍රදර්ශන පැවැත්වීමට සැළසුම් කරන ලද අතර, ජාතික වෙළඳ ප්‍රදර්ශනයක්ද පවත්වන ලදි.(වෙළඳ කුටි 160)



වෙළඳ ප්‍රදර්ශනය – මහනුවර



වෙළඳ ප්‍රදර්ශනය - කුරුණෑගල





ජාතික වෙළඳ ප්‍රදර්ශනය

ප්‍රාදේශීය වෙළඳ ප්‍රදර්ශනවල වැදගත්කම:

1. මෙහිදී ප්‍රාදේශීය මට්ටමේක්ෂුද්‍ර / කුඩාපරිමාණ ව්‍යවසායකයින්ට ඔවුන්ගේ නිෂ්පාදන හඳුන්වා දී වෙළඳපල සම්බන්ධතා ගොඩනගා ගත හැකිය. ආරම්භක අවධියේදී, ඔවුන්ට ජාතික මට්ටමේ වෙළඳ ප්‍රදර්ශන සමඟ සම්බන්ධ වීමේ දුෂ්කරතා මතුවන බැවින් මෙය මහඟු පිටිවහලකි. ඊට අමතරව, විවිධ ව්‍යාපාරික ක්ෂේත්‍රයන්හි නියැලී සිටින ක්ෂුද්‍ර / කුඩා පරිමාණ ව්‍යවසායකයින්ට තම නිෂ්පාදන ප්‍රාදේශීය වෙළඳ ප්‍රදර්ශනයේදී (මල් වගාව, ආහාර සැකසීම, හස්ත කර්මාන්ත, ඇඟලුම් යනාදී..) හඳුන්වා දිය හැකිය. ඔවුන්ගේ ව්‍යාපාරයන් පුළුල් කිරීමෙන් අනතුරුව ඔවුන්ට ජාතික මට්ටමේ වෙළඳ ප්‍රදර්ශනයන්ට සහභාගී වීමේ හැකියාව ලැබේ.

2. ව්‍යවසායකයින්ට සිය නිෂ්පාදන සඳහා පවතිනතරඟකාරීත්ව මට්ටමහඳුනා ගැනීමේ වෙළඳපල පර්යේෂණයන් සඳහා ලැබී ඇති අවස්ථාවක් වන අතර,ඔවුන්ටසිය නවතම නිෂ්පාදන, ක්‍රියාවලි, අදහස් සහ උපාය මාර්ග අත්හදා බැලීම සඳහා පරීක්ෂණ භූමියක් වශයෙන් භාවිතා කළ හැක.

3. ව්‍යවසායකයින් සහ පාරිභෝගිකයින් යන දෙපිරිසටම ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කරදීම.

4. නව හෝ අදාළ අවස්ථාව වනවිට මිල දී ගැනීමේ නිරත ගනුදෙනුකරුවන් ඉදිරියේ තම වෙළඳ නාමය ලබා ගැනීමට ව්‍යවසායකයින්ට අවස්ථාව සලසා දීම.

5. සබඳතා ජාල ගොඩනගා ගැනීමේ අවස්ථා සලසා දීම.

6. මෙම වෙළඳ ප්‍රදර්ශනය මඟින් ව්‍යවසායකයින්ට තම සැපයුම්කරුවන් හා වෙනත් ව්‍යාපාරිකයින් සමඟ සාකච්ඡා කිරීමේ පහසුකම් සැලසෙන අතර, එහිදී මතුවන අවස්ථාවන් අනුවසිය ව්‍යාපෘති ඊලඟ මට්ටමට ගෙන යාමට ඉඩ සලසයි.

දිස්ත්‍රික්කය	**වෙළඳ ප්‍රදර්ශන සංඛ්‍යාව**	**වෙළඳ කුටි සංඛ්‍යාව**
මොණරාගල	01	25
කළුතර	01	30
ගම්පහ	01	43
අනුරාධපුර	01	40
ත්‍රිකුණාමලය	03	80
අම්පාර	01	20
පුත්තලම	02	90
කුරුණෑගල	01	150
මහනුවර, නුවරඑළිය, මාතලේ	01	60
මාතර	01	80
ගාල්ල	01	70
හම්බන්තොට	01	45
කෑගල්ල	01	10
වවුනියාව	01	21
	17	**764**

වැඩසටහන 6: ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන

ශ්‍රී ලංකාවේ ප්‍රගතිය හා සමාජ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමේ වැදගත් උපාය මාර්ගික අංශයක් ලෙස ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (MSMEs) හඳුනාගෙන තිබේ. වසර ගණනාවක් පුරා, ප්‍රධාන රැකියා ප්‍රභවයක්, ආදායම් උත්පාදනය කිරීමේ මාර්ගයක්, දරිද්‍රතාවය පිටුදැකීමේ සහ ප්‍රාදේශීය සංවර්ධනය ඇතිකිරීමේ මාර්ගයක්වශයෙන් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්වෙතපුළුල් පිළිගැනීමක් හිමි ව ඇත. කෘෂිකර්මාන්තය, පතල් කැණීම, නිෂ්පාදනය, ඉදිකිරීම් සහ සේවා අංශයේ කර්මාන්ත වැනි ආර්ථික ක්‍රියාකාරකම්වල පුළුල් ක්ෂේත්‍රයක් මෙකී ව්‍යවසායයන් මගින්ආවරණය කරයි.

නිෂ්පාදන ක්‍රියාවලිය හා සාධක වෙළඳපල සහ ඒවා ක්‍රියාත්මක වන නියාමන පද්ධතියෙන් මතුවන ගැටළු හේතුවෙන්ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි වර්ධනය හා ව්‍යාප්තිය සීමා වී ඇත. මෙකී ගැටළු, මූල්‍ය ප්‍රතිපාදන වෙත ප්‍රවේශය, භෞතික යටිතල පහසුකම්, තාක්ෂණික මට්ටම, නියාමන රාමුව, තොරතුරු හා උපදෙස් සඳහා ප්‍රවේශය, වෙළඳපල වෙත ප්‍රවේශය, ව්‍යාපාර සංවර්ධන සේවා, කාර්මික සම්බන්ධතා සහ කම්කරු නීති, බුද්ධිමය දේපළ අයිතිවාසිකම්, තාක්ෂණික හා කළමනාකරණ කුසලතා, සම්බන්ධතා ගොඩනැගීම සහ පාරිසරික ගැටළුයනාදී පුළුල් ක්ෂේත්‍රයක් පුරා විසිර පවතී.

බොහොමයක් ව්‍යවසායකයින්ට ව්‍යවසායකත්වය, අලෙවිකරණය, තාක්ෂණය හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොමැතිකමවැනි ගැටළු පවතින බව ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් හඳුනා ගන්නා ලදි. එසේම, ඔවුන්ගේ ව්‍යාපාරය ආරම්භ කිරීමට / පුළුල් කිරීමට අවශ්‍ය වන්නා වූ මූල්‍ය ප්‍රතිපාදන සපයා ගැනීමේ බාධක වලට මුහුණ පෑමටද ඔවුන්ට සිදුවතිබේ. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේසංවර්ධන නිලධාරීන් ප්‍රාදේශීය මට්ටමින් කාර්යයන් ඉටුකරමින් සිටින අතර, ඉහත කී ගැටළු සඳහා විසඳුම් අවශ්‍ය වන්නා වූ ව්‍යවසායකයින් ඔවුන් විසින් හඳුනාගනුලබයි.

එබැවින්, සියලුම දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය මට්ටමේ ව්‍යවසායකයින් සඳහා කෙටිකාලීන ධාරිතා සංවර්ධන පුහුණුව, මූල්‍ය ආධාර, වෙළඳපල පහසුකම් සහ වෙනත් ව්‍යවසාය සංවර්ධන සේවා සහ පසු විපරම් සේවා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින්ක්‍රියාත්මක කරයි. තව ද, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියවිසින් සංවර්ධන නිලධාරීන්ගෙන් ව්‍යාපෘති යෝජනා ලබාගෙන ප්‍රාදේශීය / දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍යමය සහාය සපයනු ලබයි.



තාක්ෂණික පුහුණුව – පූජාපිටිය



තාක්ෂණික පුහුණුව– කුරුණෑගල



තාක්ෂණික පුහුණුව – අනුරාධපුර



තාක්ෂණික පුහුණුව – කළුතර

2019 වර්ෂයේදී, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් නවක හා කර්මාන්තය තුළ සිටින ව්‍යවසායකයින් 14521 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් 389ක් පවත්වන ලදි.

දිස්ත්‍රික්කය	**පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව**	**පුහුණු කරන ලද ව්‍යවසායකයින් සංඛ්‍යාව**
මොණරාගල	15	397
බදුල්ල	12	726
කොළඹ	03	100
ගම්පහ	13	650
කළුතර	14	725
අනුරාධපුර	20	1025
පොළොන්නරුව	01	32
අම්පාර	26	685
මඩකළපුව	20	521
ත්‍රිකුණාමලය	06	191
කුරුණෑගල	58	1719
පුත්තලම	13	1769
මාතලේ	09	828
මහනුවර	17	524
නුවරඑළිය	01	56
මාතර	45	435
ගාල්ල	25	435
හම්බන්තොට	08	535
කෑගල්ල	17	612
යාපනය	24	603
කිළිනොච්චිය	07	145
වවුනියාව	18	55

මන්නාරම	01	72
මුලතිවු	08	216
රත්නපුර	08	1200
එකතුව	**389**	**14551**

තව ද, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් පහත දක්වා ඇති පරිදි නව ව්‍යාපාර 857ක් ස්ථාපිත කිරීමට සහ පවතින ව්‍යාපාර 1456ක් පුළුල් කිරීමට කටයුතු කරන ලදි.

දිස්ත්‍රික්කය	**ස්ථාපිත කරන ලද නව ව්‍යාපාර සංඛ්‍යාව**	**පුළුල් කරන ලද ව්‍යාපාර සංඛ්‍යාව**
මොණරාගල	47	28
බදුල්ල	60	182
කොළඹ	15	11
ගම්පහ	68	85
කළුතර	92	33
අනුරාධපුර	07	37
මඩකළපුව	35	17
අම්පාර	26	35
ත්‍රිකුණාමලය	05	0
මාතර	30	15
ගාල්ල	08	09
හම්බන්තොට	60	34
කුරුණෑගල	100	313
පුත්තලම	86	267
මාතලේ	103	227
මහනුවර	60	104
නුවර එළිය	22	28
කෑගල්ල	16	13
රත්නපුර	17	18
යාපනය	35	0
කිළිනොච්චිය	13	0
වවුනියාව	57	27
එකතුව	**964**	**1483**

වැඩසටහන 7: විකාශන හා තාක්ෂණ හුවමාරු මධ්‍යස්ථානය (ITTC) පිහිටුවීම - මාකඳුර

විකාශන සහ තාක්ෂණ හුවමාරු මධ්‍යස්ථානය (**ITTC**) යනු වෘත්තීයමය සහාය ලබාදීම තුළින්නව නිෂ්පාදනයක් හෝ සේවා සැපයුමක් සඳහාආයෝජනය කළ යුතු මූලික ප්‍රාග්ධනය අඩු කොට ඒ සඳහා දැරිය යුතු අවදානම අවම කරන ආයතනයකි.

මෙම ව්‍යාපෘතියේ පරමාර්ථය වනුයේ ප්‍රදේශයේ ක්ෂුද්‍ර හා සුළු කර්මාන්ත සඳහා පහසුකම් සැලසීමසහ විශ්ව විද්‍යාල අධ්‍යාපනයෙන් සමුගත් උපාධිධාරීන් ස්වෝත්සාහයෙන් නැගී සිටින තෙක් ව්‍යාපාර ආරම්භනයට පහසුකම් සැළසීමයි. ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ (**WUSL)** සහ ආශ්‍රිත පර්යේෂණ ආයතනවල පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් වලින් ලබාගත් නව ව්‍යාපාරික අදහස් සමඟ අවශ්‍ය යන්ත්‍රෝපකරණ හා උපකරණ සමඟ ව්‍යාපාර ආරම්භ කිරීමටවිකාශන සහ තාක්ෂණ හුවමාරු මධ්‍යස්ථානයපහසුකම් සපයයි. විකාශන සහ තාක්ෂණ හුවමාරු



මධ්‍යස්ථානයපිහිටුවීම**,** කළමනාකරණය සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය,ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය සමගඅවබෝධතා ගිවිසුමකට එළඹුණි. විකාශන සහ තාක්ෂණ හුවමාරු මධ්‍යස්ථානයයනු සමාගම් ලියාපදිංචි කිරීමේ ආයතනය යටතේ ලියාපදිංචි, කළමනාකරණ මණ්ඩලයක් විසින් පාලනය කරනු ලබන සමාගමකි. ආයතනය**2017** සැප්තැම්බර් මස විවෘත කරන ලද අතර, වර්තමානයේදී ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සහාය ලබාගන්නා ව්‍යවසායකයින්ට සහ විශ්ව විද්‍යාල උපාධිධාරීන්ට මෙම ආයතනය මගින් සේවා සපයනු ලබයි.

වැඩසටහන 8: .Uni-ව්‍යවසායකයෝ (උපාධිධාරි ව්‍යවසායකත්ව උදානය)

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්, රටේආර්ථික සංවර්ධන ක්‍රියාවලියේදී මෙන්ම දුප්පත්කම තුරන් කිරීම හා විරැකියාව විසඳීම සම්බන්ධයෙන්තීරණාත්මක කාර්යභාරයක් ඉටු කලහැකි ක්ෂේත්‍රයක් වශයෙන්හඳුනාගෙන ඇත. සංඛ්‍යාලේඛනවලට අනුව, 2013 වර්ෂයේදී රැකියා සැපයීම සහ දළ දේශීය නිෂ්පාදනය (GDP) යන අංශයන්හි තීරණාත්මක කාර්යභාරයක් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක ක්ෂේත්‍රය මගින් ඉටුකර ඇති අතර,එයමෙරට දළ දේශීය නිෂ්පාදිතයෙන් 40% ක් විය. තව ද, 2014 වර්ෂයේදී කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ දායකත්වය දළ දේශීය නිශ්පාදිතයෙන්52%කි. විශේෂයෙන්, ජාත්‍යන්තර කම්කරු ආයතනයේ (ILO) සංඛ්‍යාලේඛනමගින් පෙන්වා දෙනුයේ රැකියා විරහිත තරුණ තරුණියන්ගේ අනුපාතය අඛණ්ඩ ලෙස ඉහළ යාමක් පෙන්නුම් කරන බවත්,මෙම තරුණ විරැකියාව පිළිබඳ ගැටලුවට එක් විසඳුමක් වනුයේව්‍යවසායක නිරත වීමට තරුණ තරුණියන්ට සහාය වීම බවත්ය.

මෙම කරුනු පිළිබඳ අවබෝධයෙන්, උපාධිධාරීන්ගේ හැකියාවන් වර්ධනය කොට, ව්‍යාපාරික ලෝකයට ප්‍රවේශ වීමේ අවස්ථා උදාකර ගතහැකි සාර්ථක ව්‍යවසායකයින් වශයෙන් ගොඩනැගීම උදෙසා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් විශ්ව විද්‍යාල උපාධිධාරින් දිරිමත් කිරීමේ විශේෂ පුහුනු වැඩසටහනක් ආරම්භ කරන ලදි. මෙකී මූලාරම්භයට ක්‍රියාකාරී පරිසරයක් නිර්මාණය කිරීමෙහිලා ව්‍යවසායකත්ව අධ්‍යාපනය තීව්‍ර අන්දමින් ලබාදීමට හා මෘදු කුසලතා සංවර්ධනය කිරීම සඳහා වඩාත් ශක්තිමත් ක්‍රියාමාර්ග අනුගමනය කළයුතුව ඇත.ව්‍යවසායකත්ව උපාධිධාරීන් බිහිකිරීම සඳහා විශ්ව විද්‍යාලවල වර්තමානයේ පවත්නා රැකියා මාර්ගෝපදේශ ඒකක මගින් තීරණාත්මක කාර්යභාරයක් ඉටුකරනු ලබන බව ජාතික ව්‍යවසාය සංවර්ධන ආයතනයේ මතයයි, ඒ අනුව මෙම

ඒකක උපාධිධාරී ව්‍යවසායකයින් බිහිකිරීම මගින් අන්‍යයන්ටද රැකියා අවස්ථා නිර්මාණය කරලීමේ ඒකකයක් ලෙසහැඳින්විය හැක.

එසේ වුවත්, සමාජ පීඩනය සහ ව්‍යවසායකයෙකු වීමෙන් ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ අවබෝධයක් නොමැතිකම හේතුවෙන් උපාධිධාරීන් වෙනත් රැකියාවන්හි නිරත වීමේ ප්‍රවණතාවයක් දක්නට ඇත. එපමණක් ද නොව, ව්‍යවසාය අවස්ථා පිළිබඳ දැනුමක් නොමැතිකම, ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ප්‍රමාණවත් දැනුමක් නොමැතිකම, ආරම්භක ප්‍රාග්ධනයේ ඌනතාවය සහ ව්‍යාපාර කටයුතුවලදී මතු විය හැකි අවදානම යනාදී හේතු මත උපාධිධාරීන් ව්‍යාපාර කටයුතුවල නියැලීමට පසුබෑමක් දක්වයි. එකී කරුණු සැලකිල්ලට ගනිමින්,ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් උපාධිධාරී ව්‍යවසායකත්ව උදානය වැඩසටහන නිර්මාණය කොට හඳුන්වා දෙන ලදි.

උපාධිධාරීන් ව්‍යාපාර ක්ෂේත්‍රයට සම්බන්ධ කර ගැනීම සඳහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියවිශ්ව විද්‍යාල සමඟ එක්ව ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන දියත් කරයි. උපාධිධාරීන් සඳහා ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීමේ මෙම වැඩසටහන**“උපාධිධාරී ව්‍යවසායකත්ව උදානය”**ලෙස නම් කර ඇත. මෙම වැඩසටහනේ පරමාර්ථය වනුයේ ව්‍යාපාරික ක්ෂේත්‍රයට පැමිණීමට උපාධිධාරීන් දිරිමත් කිරීම සහ ඔවුන් සාර්ථක ව්‍යවසායකයින් වශයෙන්ගොඩනැගීමයි.





උපාධිධාරීව්‍යවසායකත්ව උදානය - ආරම්භක උත්සවය

2019වර්ෂයේ දී,ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියවිසින් ශ්‍රී ජයවර්ධනපුර, දෘශ්‍ය හා ප්‍රසාංගික කලා, කැලණිය, පේරාදෙණිය, වයඹ සහ යාපනය යන විශ්ව විද්‍යාලවල උපාධිධාරීන් 304 දෙනෙකුට ව්‍යවසායකත්ව සංවර්ධනපුහුණුව හා උපාධිධාරීන්72 දෙනෙකුට මූල්‍ය ආධාර (ප්‍රදාන) ලබා දී ඇත.

වැඩසටහන 9: ආධාරක දැනුමෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් ඉහළ නැංවීම

ව්‍යාපාර සහතික කිරීම, වෙළඳ සන්නාම හා නව අලෙවිකරණ උපායමාර්ග, සේවා ගුණාත්මකභාවය හා පාරිභෝගික ආරක්ෂාව, ව්‍යාපාර නීති හා රෙගුලාසි යනාදිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්අදාළ ආයතනවල සහාය ඇතිව ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින්පවත්වනුලැබේ.

පහත දක්වා ඇති වැඩසටහන් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් පවත්වා ඇත.

දිස්ත්‍රික්කය	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගීවූවන් සංඛ්‍යාව
මොණරාගල	04	300
බදුල්ල	06	504
කොළඹ	02	87
ගම්පහ	07	350
කළුතර	08	425
අනුරාධපුර	08	398
මඩකළපුව	07	685
අම්පාර	05	382
ත්‍රිකුණාමලය	04	365
මහනුවර	08	408
මාතලේ	07	407
නුවරඑළිය	03	163
කුරුණෑගල	07	379
පුත්තලම	08	441
ගාල්ල	07	310
මාතර	08	350
හම්බන්තොට	08	380
රත්නපුර	08	1200
කෑගල්ල	06	240
යාපනය	03	245
කිළිනොච්චිය	01	60
වවුනියාව	01	90
මන්නාරම	01	40
මුලතිවු	02	140
Total	**129**	**8334**



දැනුවත් කිරීමේ වැඩසටහන-මාවනැල්ල

වැඩසටහන 10: ව්‍යවසායකත්ව සංවර්ධනය තුළින් ශ්‍රී ලාංකික තරුණ තරුණියන් නගා සිටුවීම

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින්වෘත්තීය පුහුණුලාභීන් සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන පවත්වනු ලබයි. මෙම වැඩසටහන තාක්ෂණික අධ්‍යාපන හා පුහුණු දෙපාර්තමේන්තුවේ සහය ඇතිව ක්‍රියාත්මක වන අතර,බස්නාහිර පළාතෙන් මෙම වැඩසටහන ආරම්භ කරන ලදි. 2019වසරේ දී ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියවිසින් වෘත්තීය පුහුණුලාභීන්න් 100 දෙනෙකු සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුව ලබා දුන් අතර, රූපලාවණ්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ තරුණ තරුණියන් 28 දෙනෙකු සඳහා යන්ත්‍ර හා උපකරණ ලබා දීමට කටයුතු කරන ලදී.

වැඩසටහන 11: වෙනත් වැඩසටහන්

ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදල් මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘතිය:

යාපනයේ ආහාර සැකසුම් කර්මාන්තයේ නියැලෙන කාන්තා (පොකුරු) ව්‍යවසායකයින් සඳහා ව්‍යාපාර සැලසුම් පුහුණුව (ප්‍රතිලාභීන් 60 ක්) සහ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 60 දෙනෙකු සඳහා ඇසුරුම්කරණ පුහුණු වැඩසටහනක් පවත්වන ලදි.

INCEE සිමෙන්ති:

මහනුවර, හම්බන්තොට, මොණරාගල, ගාල්ල, රත්නපුර, බදුල්ල, අනුරාධපුර, මාතර, පුත්තලම සහ යාපනය යන ප්‍රදේශවල පෙදරේරු (මේසන්) ව්‍යවසායකයින් 2812සඳහා පුහුණු වැඩසටහන. (NVQ L 111 සුදුසුකම් ලැබූවන්112)

සමාජයීය ව්‍යාපෘති:

පොළොන්නරුව- සංවර්ධන ව්‍යාපෘතිය සඳහා තෝරා ගැනීමට කාන්තා ව්‍යවසායකයින් 30 දෙනෙකු වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන. සංවර්ධන නිලධාරීන් 40 දෙනෙකු සඳහා පුහුණුුකරුවන් පුහුණු කිරීමේ (TOT)(සමාජ ව්‍යවසාය සංවර්ධනය) වැඩසටහනක් පැවැත්වීම. වෙළඳ ප්‍රදර්ශනයට සහභාගී වීමට (ව්‍යවසායකයින්ට) අවස්ථාවසලසා දීම.

එච්අයි (මානුෂීයත්වය සහ ඇතුළත්භාවය පිළිබඳ) වැඩසටහන:

වැලිමඩ, හාලිඇල, පස්සර සහ ලුනුගල ප්‍රදේශවල කිරි නිශ්පාදන, එළවළු සහ පලතුරු යන නිශ්පාදන සම්බන්ධයෙන් අගය දාම සංවර්ධන වැඩසටහන. මොණරාගල, බිබිල, වැල්ලවාය සහ බඩල්කුඹුර ප්‍රදේශවල විශේෂ කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන. ජාතික ව්‍යවසායකත්ව සංවර්ධන මණ්ඩලයේකාර්ය මණ්ඩලය සඳහා එක් දින ව්‍යාපාර උපදේශන වැඩසටහන. ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංසදසඳහා සහාය ලබාදීම(මාතලේ, බදුල්ල, මොණරාගල සහ නුවර එළිය දිස්ත්‍රික්ක).

You Lead(ඔබ නායකත්වය දෙන්න) **ව්‍යාපෘතිය**: ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සංවර්ධන නිලධාරීන් 26 දෙනෙකු සඳහා ව්‍යවසායකත්ව සංවර්ධනය පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීමේ (TOT)වැඩසටහන. ආහාර හා රෙදිපිළි ව්‍යවසායකයින් සඳහා වෙළඳපල සම්බන්ධතා ගොඩනගා ගැනීම පිළිබඳ දැනුවත් කිරීම.



UNDP(එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන)**ව්‍යාපෘතිය**: මැදිරිගිරිය, ලංකාපුර, වලපනේ සහ මහවැලි ප්‍රදේශයේව්‍යවසායකයින් 80දෙනෙකු සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන. සාර්ථක වෙළඳපල වෙත ව්‍යවසායකයින් හඳුන්වා දීමෙන් රෙදිපිළි හා ආහාර නිශ්පාදන සඳහා වෙළඳපල සම්බන්ධතා පුළුල් කිරීම.

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශනය

	සටහන්	2019 රු.	2018 රු.
වැඩසටහන් සඳහා ලද ප්‍රතිපාදන හා චිතය			
වර්ෂය සඳහා සක්‍රිය වෙන්කිරීම්	18	37,057,416	28,557,098
වැඩසටහන් සඳහා වියදම්	9	37,057,416	28,557,098
වාර්ෂික වැඩසටහන්වල අතිරික්තය/(හිඟය)		-	-
මෙහෙයුම්			
මහ භාණ්ඩාගාර පුනරාවර්තන වෙන්කිරීම්		25,260,257	24,617,557
රාජ්‍ය ප්‍රතිපාදන මගින් ක්‍රමක්ෂය සඳහා වෙන්කිරීම්	14	2,545,873	2,505,842
වෙනත් ආදායම්	7	825,256	6,121,726
ආදායම් එකතුව		**28,631,386**	**33,245,125**
පරිපාලන වියදම්	8	29,499,033	26,600,152
වෙනත් ව්‍යාපාති සඳහා වියදම්	9	-	2,999,340
වියදම් එකතුව		**29,499,033**	**29,599,492**
වාර්ෂික වැඩසටහන්වල අතිරික්තය		**(867,647)**	**3,645,633**

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන්	2019 රු.	2018 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	10	5,752,892	7,476,170
ජංගම වත්කම්			
ලැබීම්	11	1,754,416	374,591
තැන්පතු හා අත්තිකාරම්	12	89,970,926	103,179,402
පෙරගෙවුම් වියදම්	13	98,604	93,716
උත්සව අත්තිකාරම්		24,000	9,000
ආපදා ණය		2,232,034	2,095,588
මුදල් හා මුදල් සමානතා		351,521	2,016,990
සී/ස බී එක්ස්ප්‍රස් සමාගම	22	600	46,450,000
ජංගම වත්කම් එකතුව		**94,432,100**	**154,219,287**
ඉතිරිකිරීමේ ගිණුම් - පාරිතෝෂික		583,670	561,941
වෙනත් ජංගම වත්කම් එකතුව		**583,670**	**561,941**
වත්කම් එකතුව		**100,768,662**	**162,257,401**
හිමිකම් සහ වගකීම්			
සමුච්චිත අතිරික්තය		2,405,900	49,798,341
හිමිකම් එකතුව		**2,405,900**	**49,798,341**
ජංගම නොවන වගකීම්			
රාජ්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම්	14	2,899,092	4,867,072
විශ්‍රාම ප්‍රතිලාභ	15	1,692,735	1,051,929
ජංගම නොවන වගකීම් එකතුව		**4,591,827**	**5,919,000**
ජංගම වගකීම්			
වැඩසටහන් සඳහා වෙන්කිරීම්	16	89,676,008	104,067,179
උපචිත වියදම්	17	3,831,070	1,745,747
අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘතිය	18	76,630	539,906
M/s.UNDP	18	187,228	187,228
ජංගම වගකීම් එකතුව		**93,770,936**	**106,540,060**
හිමිකම් හා වගකීම් එකතුව		**100,768,662**	**162,257,401**

පිටු අංක 05සිට 19 දක්වා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයේ අනිවාර්ය අංගයකි

අධිකාරියෙහි මූල්‍ය ප්‍රකාශනයන් ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත සමඟ ඒකඟ වන බවට මම සහතික කරමි.

ගණකාධිකාරී

අත්සන් කළේ,

සුනිල් ජයරත්න

සභාපති/ප්‍රධාන විධායක නිලධාරී

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් කරන ලදී.

....

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වගකීම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය

	සමුච්චිත අතිරික්තය රු.	එකතුව රු.
2018 ජනවාරි 01 දිනට ශේෂය	26,303,316	26,303316
වර්ෂය සඳහා මුළු හිඟය	3,645,633	3,645,633
2017 වර්ෂය සඳහා අත්තිකාරම් ගැලපුම්	19,638,313	19,638,313
2017 වර්ෂය පෙරගෙවුම් වියදම් හා දිවියට උදාන වැඩසටහනේ ගැලපුම්	1,017,647	1,017,647
2017 වර්ෂය පරිගණක ක්ෂයවීම හා විගණන ගාස්තු හා ලිපිද්‍රව්‍ය ගැලපුම්	(806,569)	(806,569)
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	**49,798,341**	**49,798,341**
වර්ෂය සඳහා මුළු හිඟය	(867,647)	(867,647)
අත්තිකාරම් සඳහා ගැලපුම්	(43,997)	(43,997)
බී එක්ස්ප්‍රස් සමාගමේ ආයෝජනය ගැලපුම්	(46,450,000)	(46,450,000)
2018 වර්ෂය සඳහා ක්ෂයවීම ගැලපුම්	(30,797)	(30,797)
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**2,405,900**	**2,405,900**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පීඑම්/ පී /සෙන්ඩිඩ්/ ලෝඩස් /2019 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 මැයි 04 දින

සභාපති,
ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ 2019 දෙසැම්බර් දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාරෝපණය කළ මතය

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, කාරණයන් වැදගත් මිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ වීක්ෂණය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරවූ ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාරෝපණය කළ මතය සඳහා පදනම් හෙටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන මුලින් 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එම මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා මිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 මත්තිවාරණයාය කළ මිනය සඳහා පදනම්

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල බොරිම

ශ්‍රී.ලං.ගි.ප්‍ර. 16 - දේපල මිරියන හා උපකරණ

(අ) ප්‍රමිතයෙහි 51 ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම් සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩු තරමින් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම සමාලෝචනය කළ යුතු අතර අවස්ථා තත්ත්වයන් අනුව දී කළ ඇස්තමේන්තුවලින් වෙනස් වන්නේ නම් එම වෙනස්කම් ශ්‍රී.ලං.ගි.ප්‍ර අංක 8 ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනසක් ලෙස ගිණුම්ගත කළ යුතුය. කෙසේ වෙතත්, 2019 දෙසැම්බර් 31 දිනට ලියාපදිංචි අගය රු.5,752,892 ක් වූ මෝටර් රථ, කාර්යාල උපකරණ, ලිහිල් හා සවිකිරීම්, පරිගණක හා උපාංග සහ යන්ත්‍රෝපකරණ වල අවශේෂ වටිනාකම් සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය සමාලෝචනය කර නොමිලිණි.

(ආ) ප්‍රමිතයෙහි 79 (ආ) ඡේදය ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වුවත් තවමත් භාවිතයට ගනු ලබන දේපල මිරියන හා උපකරණ වල ධාරණ අගය මූලය ප්‍රකාශන වල හෙළිදරව් කළ යුතු වුවද, සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වුවත් තවමත් භාවිතයට ගනු ලබන මෝටර් රථ 03ක, කාර්යාල උපකරණ 28 ක, ලිහිල් හා සවිකිරීම් 30 ක සහ පරිගණක සහ උපාංග 38 ක ධාරණ අගය මූලය ප්‍රකාශන වල හෙළිදරව් කර නොමිලිණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සමාලෝචිත වර්ෂයේදී වැඩසටහන් වෙනුවෙන් යෙදවිය හැකි පුද්ගලයන්ගේ වෙනුව රු. 40,678,286 ක් වූවද , එය මූලය ප්‍රකාශනයේ රු. 37,057,416 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු. 3,620,870 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක වන Know how වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂයේ මූදලින් දරන ලද වියදම රු. 3,456,847 ක් වූවද, වර්ෂයේ වියදම් රු. 2,130,773 ක් වශයෙන් සහ අමාත්‍යාංශයෙන් ලැබෙන බවට තහවුරු කොටු රු.1,326,074 ක් අමාත්‍යාංශයෙන් ලැබියයුතු මූදලක් වශයෙන් මූලය ප්‍රකාශනයේ දක්වා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ වැඩසටහන් වියදම් රු. 1,326,074 කින් අඩුවෙන් සහ ලැබියයුතු ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී අධිකාරිය වෙත ප්‍රදානයක් වශයෙන් ලද රු. 275,500 ක් වූ මේටර් බයිසිකලයක් මූල්‍ය ප්‍රකාශනවල වෙනත් ආදායමක් වශයෙන් හඳුනාගැනීම හේතුවෙන් වර්ෂයේ ලාභයට සහ ප්‍රදාන ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම්

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ

සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූලික ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූලික ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම් සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, වාර්ෂ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

    - අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම මිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

    - භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
    - සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්නරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූලික ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල වපුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සම්මත ඉදිරිපත් කිරීම් අඟයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.2 මාගේ වාර්තාවේ නත්ත්වාගණනය කල මිනය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සම්බන්ධ අනුරූප වේ.

2.1.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධව යම් නිවුසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනෘජාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින්

නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම
(අ) 2006 අංක 17 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරී පනත	
(i) 13(අ)	විදේශ වෙළෙඳපලවල් ජයග්‍රහණය කිරීමට හැකි දේශීය ව්‍යවසායන් ජාත්‍යන්තරකරණය කිරීමේ අරමුණින් ව්‍යවසායන් ශ්‍රී ලංකාවෙන් පිට පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම උනන්දු කරවීම සඳහා දිරි ගැන්වීමට කටයුතු කර නොතිබුණි.
(ii) 13(ඇ)	නාක්ෂණික දියුණුව , නිෂ්පාදන සංවර්ධනය සහ ඒටන්ට් අයිතියේ වාණිජකරණයට අදාල පර්යේෂණ සහ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා නාක්ෂණික සංවර්ධන අරමුදලක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 103 හා 104	අධිකාරිය සතුව තිබූ රු.203,890 ක් වටිනා ලැප්ටොප් පරිඝණක දෙකක් හා රු.61,900 ක් වටිනා වැඩි පරිඝණක යන්ත්‍ර දෙකක් අස්ථානගත වී තිබුණද ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.
(i) මුදල් රෙගුලාසි 395 (ඇ)	බැංකු ගිණුමක් ඇති සෑම ආයතනයක් විසින්ම එක් එක් මාසය අවසානයේ දී ඇති ශේෂදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15

		වෙනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයන් සිදියෙල කළයුතු වුවත් අධිකාරිය විසින් 2019 වර්ෂයට අදාලව බැංකු සැසඳුම් සිදියෙල කර විගණනයට ඉදිරිපත් නොකෙරුණි.
(ii)	මුදල් රෙගුලාසි 507 හා 756	දෙසැම්බර් මස 31 දිනට භාණ්ඩ සමීක්ෂණයක් කර වාර්තාවක් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළයුතු වුවත් 2017 , 2018 හා 2019 වර්ෂ සඳහා මෙම වාර්තාවේ දින වන විටත් භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි.
(iii)	2006 අංක 12 දරන මුද්දර පනත හා 2008 ජනවාරි 01 දිනැති අංක 1530/13 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය	රු.25,000 ට වැඩි ගෙවීම් සඳහා රු.25 ක් වූ මුද්දර ගාස්තු අයකල යුතු වුවද අවස්ථා 72 දී රු. 7,325,000 ක ගෙවීම් වලට අදාලව මුද්දර ගාස්තු අඩුකර ගෙන නොතිබුණි.

3. අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) 2003 ජුනි 02 දිනැති අංක 1372/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව මිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් තුළ සංස්ථාවේ මූලික ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයට අදාල මූලික ප්‍රකාශන මාස 36 ක ප්‍රමාද කාලයකින් පසුව 2023 පෙබරවාරි 28 වන දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණු අතර කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ආර්ථික සංවර්ධනය සඳහා ව්‍යවසායකයින්ගේ දායකත්වය ඇගයීමට ප්‍රාදේශීය ව්‍යවසාය සම්මාන උළෙල 9ක් හා ජාතික ව්‍යවසාය සම්මාන උළෙලක් පැවැත්වීම සඳහා රු.8,000,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර ඒ වෙනුවෙන් රු.6,020,000 ක් වැයකර තිබුණි. කෙසේ වුවද, පළාත් 05 ක පමණක් සම්මාන උළෙලවල් පවත්වා තිබූ අතර ජාතික ව්‍යවසාය සම්මාන උළෙල 2019 දෙසැම්බර් 31 දින වන විටත් පවත්වා නොතිබුණි.

(ඇ) 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ අනුව ව්‍යාපාර දත්ත පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා රු.1,000,000 ක් ප්‍රතිපාදනය කර තිබුණි. කෙෂුදු සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතිය ස්ථාපිත කිරීම හා එම පද්ධතිය තුළින් ව්‍යවසායකයින් සංවර්ධනය කිරීම අපේක්ෂාකර තිබුණු අතර පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා පරිගණක මිලදී ගෙන බෙදා දීමේ උත්සවය සඳහා රු.120,000 ක් වියදම් කර තිබුණි. එසේ වුවද, 2019 දෙසැම්බර් 31 දින වන විටත් ව්‍යාපාර දත්ත පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි.

(ඈ) ISO සහතිකය ලබා ගැනීම සඳහා 2016 වර්ෂයේ රු.71,762 ක් ද 2017 වර්ෂයේ රු.125,000 ක්ද 2018 වර්ෂයේ රු.35,880 ක්ද වශයෙන් එකතුව රු.232,642 ක මුදලක් වැයකර තිබුණද ISO සහතිකය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) නරුණ ව්‍යවසාය සංවර්ධන වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ අමාත්‍යාංශය විසින් අධිකාරිය වෙත රු.1,140,000 ක මුදලක් ලබා දී තිබුණද, වර්ෂය තුළ කිසිදු වැඩසටහනක් පවත්වා නොතිබුණි.

(ඊ) Know How වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ලබා දුන් අත්තිකාරම් මුදල් ඉක්මවා රු.2,605,147 ක් සමාලෝචිත වර්ෂයේදී වැයකර තිබුණද වැඩිපුර දරන ලද මුදල් ප්‍රතිපූරණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.ඕ.සී. විතුමරත්න
විගණකාධිපති